# ධර්මාධිපත්‍යය වපුරන උඳුවප් මාසය

අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ ජීවමාන බුද්ධ ශක්තියේ ධර්මාධිපත්‍යය පතුරමින් ජීවමානව වැඩ සිටින සිරිමා බෝ සමිඳුන් ලක්දිවට වැඩම කරන ලද්දේ උඳුවප් මාසයකයි. ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේ විසින් උරා ගන්නා ලද නිකෙලෙස් කුළුඳුල් බුද්ධ ශක්තිය නොහොත් ධර්මාධිපත්‍යය විකිරණ ශක්ති තරංග මගින් විසිරුවා සිරිලක්දිව පුරා සද්ධර්ම බලය වැපිරීමේ ශාසනික කාර්‍ය්‍යය ආරම්භ වූ උඳුවප් මාසය උඳුවප් නමින් හැඳින්වීම ඉතා අර්ථාන්විතයි.

උඳුවප් යන්නෙහි සරල තේරුම උඳු වපුරන මාසය යන්නයි. ඒත් භාෂා පරිණාම න්‍යාය අනුව රික් යන්න රුක් වන්නා සේ, රිපු යන්න රුපු වන්නා සේ, සංස්කෘත ඉන්ද්‍රගෝපක යන්න උඳුගොවු වන්නා සේ, අධිපතිබව කියන ඉඳු යන්න උඳු වී ඉන්ද්‍ර භාවය නමැති ඉඳුබව නොහොත් ආධිපත්‍යය වපුරන යන අරුතින් උඳුවප් මාසය යන්න හැදෙන්න පුළුවන් වෙනව.

අප ජීවත්වන විශ්වයට අයත් සියළුම දේ ත්‍රිමූර්තිය, යොහෝවා, දෙවියන් වහන්සේ, හෝ අල්ලා යනුවෙන් ජීවමාන ආත්මයක් ලෙස මූර්තිමත් කොට ඇති ස්වභාව ධර්මයේ ආධිපත්‍යයට යටත්වෙනව. බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා පවා ස්වභාව ධර්මයට යටත්. උන්වහන්සේලා වියපත්ව, ජරාජීර්ණව, ලෙඩ රෝග වලට ගොදුරු වී අවසන් සුසුම හෙලන්නේ ස්වභාව ධර්මයට යටත්වයි. මේ අනුව විශ්වයේ අධිපතියා ස්වභාව ධර්මයයි. ඒ ධර්මයට අනුරූජීවීම සද්ධර්මයයි. පටහැනිවීම අසද්ධර්මයයි.

සිරිමා බෝ සමිඳු දුමිඳු යනුවෙන් හැඳින් වෙන්නෙ ශ්‍රී සද්ධර්මයේ ධර්මාධිපත්‍යය පතුරවමින් වෘක්ෂයන් අතර අධිපති වෘක්ෂය බවට පත්වී තිබෙන නිසයි. එසේ සිරිමා බෝ සමිඳු වෘක්ෂයන් අතර අධිපතිබවට පත්වූයේ බුදුන්වහන්සේ බුද්ධත්වයෙන් පසු සත් සතියක් බෝ සමිඳුන් ඇසුරේම වැඩවසමින් ඒ බෝධිවෘක්ෂයට බුද්ධ ශක්තිය කැවූ නිසයි. අද ඒ මුල් බෝසමිඳුන් නැතත් අනුරාධපුර මහමෙව්නා උයනේ ජීවමානව වැඩ සිටින්නේ ඒ මුල් බෝ සමිඳුන්ගේ දක්ෂිණ ශාඛාවයි.

ශ්‍රී දළදා වහන්සේ ඇතුළු සර්වඥධාතූන් වහන්සේලාත්, ශ්‍රී මහා බෝධීන් වහන්සේත් අතර ඇති ප්‍රධාන වෙනස නම් බුදුන්වහන්සේගේ මෘත ශරීරයේ අස්ථිපඤ්ජරයෙන් සැදුණු ධාතූන් වහන්සේලා ස්වභාව ධර්මයට අනුව දිරාපත් වෙමින් පවතින අතර, ශ්‍රී මහා බෝධීන් වහන්සේ නිරන්තරවම පණ පෙවෙමින් සප්‍රාණික ලෙස වැඩ සිටීමයි. ඒ නිසා අදත් මුළු විශ්වය පුරාම පැතිරී පවතින සද්ධර්මාධි පත්‍යයේ ජීවමාන මූලාශ්‍රය ශ්‍රී මහාබෝධීන් වහන්සේයි. ජීවමාන බුද්ධ ශක්තිය අපට දැනෙන් නේ ඒ ශ්‍රී මහාබෝධීන් වහන්සේගෙන් විකිරණය වන ශක්ති තරංග මගිනුයි.



අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන්වහන්සේ

'ගෙන් විකිරණය වන ශක්ති තරංග මගිනුයි.

මාරයා අසද්ධර්මයේ ආධිපත්‍යය පතුරා ජීවමානව වැජඹුනත් සද්ධර්මයේ ආධිපත්‍යය දරමින් අද ජීව මානව වැඩසිටින්නේ ශ්‍රී මහා බෝධීන් වහන්සේයි. උන් වහන්සේ වැඩසිටින්නේ විශ්ව සාධාරණ අනිත්‍ය දුක්ඛ අනාත්ම තාව දෘශ්‍යගෝචර වනසේ අවුරුදු පතා ප්‍රදර්ශනය කරමිනුයි.

මුළු බෝධීන් වහන්සේම අවුරුද්දේ එක් කාලයකදී රන්වන් බෝපත්වලින් සැරසී අලංකාරවත්ව සිටියත් තවත් කාලයකදී එම අලංකාරය ජරා ජීර්ණව කොළ වැටෙන බෝධීන් වහන්සේ ඉපලක් ලෙස දර්ශනය වන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මතා ධර්මයේ ආධිපත්‍යය අපට පැහැදිල කරමිනුයි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ හැම බීජාංකුරය කින්ම මිහිමත වපුරන්නේ ශ්‍රී සද්ධර්ම යේ ආධිපත්‍යයයි.

ඉඳුබව යනු අධිපති බවයි. එහි එන සඤක දු යන්නේ ඇති උ කාරයේ බලපෑමෙන් ඉයන්න උයන්න වෙලයි ධර්මා ධිපත්‍යය වපුරන ඉඳුවප් යන්න උඳුවප් වන්නේ-න්. මේ මාස යේදී ලක්දිව පුරා පන්සල්වල පැවැත්වෙන සංඝ මිත්තා පෙර හැරවල් බෝධි ධර්මාධිපත්‍යය වැපිරීමට රුකුලක් වෙනව.

***සම්මානිත මහාචාර්‍ය්‍ය නීතිඥ ටි. එස්. අබේවික්‍රම*** **Harrow UK**


## The Sacred Jaya Siri Maha Bodhi in Anuradhapura

Unduvap Poya is the last full-moon day of the year. It is a very important and historic day for Sri Lanka, as it was on this Poya day that Princess Sangamitta Theri arrived in Dambakolapatuna port in Jaffna with a right branch of the Sri Maha Bodhi in India accompanied by a retinue of several others. King Devanampiyatissa received the Bo sapling and the visitors with utmost respect.

The most revered site in Anuradhapura is this Sri Maha Bodhi, because it is from a cutting of the original bodhi tree in Bodhgaya, India, under which Prince Sidhartha attained enlightenment - the Buddhahood. This bodhi tree is the oldest documented tree in the world with a chronicled history stretching back over 2,000 years. It was one of favorite sites in Anuradhapura because of the bustling activity of devotees and priests. Although a busy place of worship, the Sri Maha Bodhi retains a sense of tranquility and peacefulness that makes it so special.




## වර්ෂ පූර්ණ සිහිකිරීමයි!
## වජිරඥාණ නායක ස්වාමීන් වහන්සේ



ලන්ඩන් බෞද්ධ විහාරයේ විහාරාධිපතිව වැඩවිසූ පූජ්‍ය ආචාර්‍ය්‍ය මැදගම වජිරඥාණ නාහිමියන් අපවත්වී වසරක් පිරීම නිමිත්තෙන් ලන්ඩන් බෞද්ධ විහාරයේ දී **2007** දෙසැම්බර් **15** වෙනි සෙනසුරාදා සවස **7** ට අමරාවතී විහාරාධිපති පූජ්‍ය අචාන් සුමේධෝ නාහිමියන්ගෙන් සුමධුර දහම් දෙසුමක්

**2007** දෙසැම්බර් **16** වෙනි ඉරිදා දහවල බුද්ධ පූජාව සහ සාංඝික දානයයි

ඔබ සියළුදෙනාගේ සහභාගිත්වය අපේක්ෂා කෙරේ

**වජිරඥාණ නාහිමියන්ට නිවන් සුව පතමු!**

